


යෞවනයේ සුන්දරත්වය ලොව සදා පවතියි. එදා යොවනයින් අද වියපත් වුවද යෞවනයත් එහි චමත්කාරයත් සදා ලොව ජීවත් කරවයි. මිනිස් වර්ගයාගේ පැවැත්ම පවා රඳා පවතින්නේ තාරුණ්‍යය මත නොවේද ?

යම් කලාවකට තාරුණ්‍යය මුසු වූ කල ඊට අවැසි ආනන්දය නිරායාසයෙන්ම උපදියි. අවශ්‍ය වන්නේ ප්‍රඥාන මුහු කිරීම පමණකි. ශ්‍රී ලංකාවේ ගීත ක්ෂේත්‍රයේ කාලයක් පටන් තරුණ හදවත්වලට අමතමින් තාරුණ්‍යය වෙනුවෙන් ගී ගැයූ ශිල්පිනියකි නිරෝෂා විරාජිනී. සිය ගායනීය හැකියාවන් මධුර කටහඬ හා මුහු කරමින් ගායනා ඇය සැබැවින්ම ප්‍රවීණ ශිල්පිනියකි.

මෑත කාලයේ තරුණ සිත සිය ආදරණීය හඬින් මුසපත් කරනා ගායන ශිල්පියෙකි අමල් පෙරේරා යෞවනයා. සිය පියාණන් වූ දිවංගත මර්වින් පෙරේරා ප්‍රවීණ ගායන ශිල්පියාණන්ගේ කටහඬ දායාද කොට ගත්තද තමන්ගේ ම නිර්මාණ සහ ගායනා ඉදිරිපත් කරමින් මව් බිමේ යෞවන රසිකත්වය තමන් වෙත හරවා ගන්නට සමත් වී ඇත්තේය, ඔහු.

නිරෝෂා විරාජිනියත්, අමල් පෙරේරා ශිල්පියත් එක්ව මවනා සෞම්‍ය ගී රාත්‍රියක මිහිර විඳීමට ඔවුන්ගේ යෞවනය සමඟ ඒකාන්මික වීමට මෙල්බන් හා සිඩ්නි වාසී රසිකයින් වෙනුවෙන් ප්‍රසංගයක් සංවිධානය වෙයි. ඒ "සෞම්‍ය රාත්‍රිය" යි. මෙල්බන් හි "හැම්ඉන් පාක්" ප්‍රදේශයේ "රිවර්ගම් පර්ෆෝර්මිං ආර්ට් සෙන්ටර්" ශාලාවේදී සැප්තැම්බර් මස 20 වෙනි සෙනසුරාදා සවස 6.00 වේදිකාගත වීමට නියමිත "සෞම්‍ය රාත්‍රිය" සංවිධානය කරනා " චැනිරු එන්ටර්ටේන්මන්ට්" සංවිධානයේ ධනුෂ්ක ප්‍රනාන්දු අප හා ඒ පිළිබඳව කෙටි පිළිසඳරක් සඳහා එක් විය.

"මම කලින් මනෝ අමුණුගම මහත්මයාත් එක්ක එකතු වෙලා ප්‍රසංග දෙකක් සංවිධානය කළා. විශාරද නන්දා මාලිනියත්, ටී. එම් ජයරත්න මහත්මාත්, නිරෝෂා විරාජිනියත් ගායනා ඉදිරිපත් කරපු "මනෝරාවය" 2011 දීත් සාර්ථකව වේදිකාගත කරන්න අපට පුළුවන් වුණා. ඉතින් ඒ අත්දැකීම් එක්ක මම වෙනමම පිහිටුයා ගන්න "චැනිරු එන්ටර්ටේන්මන්ට්" සංවිධානයේ මුල්ම ඉදිරිපත් කිරීමයි මේ "සෞම්‍ය රාත්‍රිය."

"මුල් වතාවල් දෙකේදී ම අපි ජ්‍යෙෂ්ඨ ශිල්පීන්ට ආරාධනා කළ නිසා මේ වාරයේ හිතුවා තරුණ ශිල්පීන් දෙපළකට ආරාධනා කරන්න. නිරෝෂාටයි, අමල්ටයි ආරාධනා කළේ ඒ නිසයි."

"ඒ වගේ ම නිරෝෂා මම ලියපු ගීතයක් ගායනා කරලා තියෙනවා. අමල පෙරේරාත් මා ලියපු ගීතයක් ගායනා කරන්න තෝරාගෙන තියෙනවා. ඉතින් ඒකත් එක හේතුවක් වුණා මේ දෙපළ "සෞම්‍ය රාත්‍රිය" ට සම්බන්ධ කරගන්න.

අමල් ඇත්තටම තාත්තාගේ ගීත ගායනා කරන්න කැමති නෑ. ටෙලි නාට්‍යවලට එහෙම ගායනා කරපු අමල්ගෙම සින්දු ලංකාවේ තරුණ අය අතර ජනප්‍රියයි. ඒ වුණාත් මෙහේ අයට ඒවා තවම ඒ තරම් හුරු නැති නිසා මර්වින් පෙරේරා මහත්තයා ගායනා කරපු ගීතත් "සෞම්‍ය රාත්‍රියේ" දී ගායනා කරනවා. ඒ වගේ ම අමල් වාදනයටත් දක්ෂ නිසා ඒ වාගේ අංගත් එක් වෙනවා ප්‍රසංගයට. නිරෝෂාත් එයාගේ ජනප්‍රියම, හොඳම ගීත ටිකක් තෝරගෙන තියෙනවා."

"සංගීත අධ්‍යක්ෂණයෙන් වගේම ශබ්ද පරිපාලනයෙන් ඉන්ද්‍රජිත් මිරිහාන තරුණ වාද්‍ය ශිල්පියා අපට දායක වෙනවා. මුල ඉඳන්ම අපට කථනයෙන් දායක වුණ සංජීව අත්තරගම සොහොයුරායි මේ ප්‍රසංගය ඉදිරිපත් කරන්නේ. ප්‍රවීණ වාද්‍ය ශිල්පීන් ගණනාවක්ම එක්ක මේ ප්‍රසංගය ඉහළ මට්ටමින් පවත්වන්නයි කටයුතු සූදානම් කරලා තියෙන්නේ."

මෙහේ පවත්වන ප්‍රසංග බොහොමයක්ම ඉදිරිපත් කරන්නේ එකම ආකෘතියකට. ඊට වඩා වෙනස් දෙයක් කරන්නයි අපි උත්සාහ කරන්නෙ. "චැනිරු එන්ටර්ටේන්මන්ට්" එකෙන් ඉදිරියේ කරන හැම ප්‍රසංගයක්ම එකිනෙකට වෙනස් ආකෘතිවලින් ඉදිරිපත් කරන්නයි අපි අදහස් කරගෙන ඉන්නෙ. ඉතින් මුල් වරට කෙරෙන මේ වෙනස බලන්න හැමෝම එන්න කියලා තමයි අපි ආරාධනා කරන්නේ..."

ධනුෂ්ක තමන්ගේ ආදරණීය ආරාධනය කළේය. අපි පාඨකයන් වෙනුවෙන් ඔහු හට ස්තූතිවන්ත වූ අතරම ඔවුනට සුභ පැතුවෙමු.

**සාකච්ඡාව**

සිසිර දිසානායක

**සන්නස නව ගිණුම් අංකය**

සන්නස පුවත්පතේ වෙළඳ දැන්වීම් සඳහා ගෙවීම් පහත දැක්වෙන සන්නස නව ගිණුමට ගෙවන්න

**Account Name** - Sannasa Media
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස මීඩියා Sannasa Media**

Looking for professional

**Migration advice ?**

The experts in all Australian visa categories with thousands of successful applications from around the world

Our Services :

**We offer you a number of services, ranging from phone consultation to lodging your migration application and appeals on your behalf. Our core services involve:**

- General Skilled Migration
- Partner Migration
- Business Migration
- Parent Migration
- Visit / Tourist Visas
- Student Visas



**Hemantha Punchihewa**
**MARN 0209063**



**Surani Punchihewa**
**MARN 0426579**

**Australian Address :**
**H&S Associates**
**737 Burwood Road,**
**Hawthorn 3123.**
**Australian Contact Number :**
**00 61 419 373 888**
**E-Mail : contact@hs-associates.com**

**AUSTRALIAN MIGRATION CENTRE**

**Sri Lankan Address :**
**5/6, Railway Avenue, Nugegoda.**
**Tele: 011 281 8 833**
**Fax: 011 281 8 835.**
**E-mail : contact@australianmigrationcentre.com**